# මහා සභා රැස්වීම් වාර්තාව

# 2022.07.14

## පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2022.07.14 වන දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මාසික මහා සභා රැස්වීම 2022 ජූලි 14 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 2. | ගරු උප සභාපති | - | ඩී.වී.උපාලි මැතිතුමා. |
| 3. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා. |
| 4. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා. |
| 5. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා. |
| 6. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා. |
| 7. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.වී.ආරියරත්න මැතිතුමා. |
| 8. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය. |
| 9. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.එස්.දීප්ති ධර්ම ශ්‍රී මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.වී.අජිත් නිශාන්ත මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.එම්.හේමන්ත පෙරේරා මැතිතුමා. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.ඉන්දික මැතිතුමා. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමා. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමා. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.පියසේන මැතිතුමා. |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.චමින්ද ගුණරත්න මැතිතුමා. |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සූරවීර මැතිතුමා. |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ටී.රිද්මා අනුරුද්ධිකා ධර්මවර්ධන මැතිතුමිය. |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය. |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සෙල්වනායගම් රගවන් මැතිතුමා. |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජී.අනෝමා ප්‍රියදර්ශනී ගාල්ලගේ මැතිතුමිය. |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ඩී.පුෂ්පලතා වැලිකල මැතිතුමිය. |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ටී.මෝහන්දාස් මැතිතුමිය. |
| 33. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා. |
| 34. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.ඉන්දික කුමාර දිසානායක මැතිතුමා. |
| 35. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 36. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා. |
| 37. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , රණවිරුවන් සිහිකිරීමෙන් පසුව ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපතිතුමා , ගරු විපක්ෂනායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01.පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම. ( 2022.06.09)**

2022.06.09 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා සංශෝධන ඇතොත් ඉදිරිපත් කිරීමටත් , සංශෝධන නොමැති නම් එම වාර්තාව සභා සම්මත කිරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ඒ අනුව 2022.06.09 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

**02.ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදනය.**

රත්නපුර මහා අධිකරණ නඩු අංක HCR/WA/08/2022 දරණ නඩුව බලංගොඩ පාර , පැල්මඩුල්ල ලිපිනයෙහි පදිංචි කුසුමා නන්දනී විජේසේකර මහත්මිය විසින් ගොනු කර ඇත.පෙත්සම්කාරිය විසින් වග උත්තර පාර්ශ්වය ලෙස ප්‍රාදේශීය සභාව , සභාපති හා ලේකම් නම් කර ඇති අතර එම නඩුව 2022/07/07 වන දින එනම් ජූලි මස සභාව පැවැත්වීමට පෙර මහාධිකරණයේ දී විභාග වීමට නියමිත බැවින් ඉහත දින ප්‍රාදේශීය සභාව වෙනුවෙන් කරුණු දැක්වීමට රත්නපුර ශේෂ්ඨාධිකරණයේ නීතිඥ ප්‍රියන්ත කරුණාතිලක මහතාගේ සේවය ලබා ගැනීම සුදුසු බව සඳහන් කරමි.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ දෙපාර්ශවයක් අතර ඇති වූ ජලය බැස යාමේ ගැටලුමක් සම්බන්ධව පෙත්සම්කාරිය විසින් වග උත්තර පාර්ශවය ලෙස ප්‍රාදේශීය සභාව , සභාපති හා ලේකම් නම් කර ඇති බවත් , ඒ සම්බන්ධව කාර්මික නිලධාරිතුමාගේ හා සෞඛ්‍ය පරීක්ෂතුමාගේ වාර්තා ආදිය ලබා ගත් බවත් , අධිකරණයට කරුණු දැක්වීමට සිදු වන බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා පවසා සිටියේ එම දෙපාර්ශවයම සභාව සමඟ කතා කළා ද යන්නය.ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ පාර්ශව දෙකම දෙවතාවක් ම කැඳවූ නමුත් එක් පාර්ශවයක් නොපැමිණි බවත් ය.

අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ දෙපාර්ශවයක් අතර ඇති වූ ගැටලුවකට සභාව සම්බන්ධ කර ගැනීමත් , සභාව විසින් මෙම ගැටලුව පරීක්ෂා කර පිළිතුරක් ලබා දීම සඳහා දෙපාර්ශවයම දෙවතාවක් සභාවට කැඳවූ නමුත් එක් පාර්ශවයක් නොපැමිණීමත් යන කරුණු හේතුවෙන් මෙම නඩුව සඳහා සභාව වෙනුවෙන් යන මුදල් නැවත අය කර ගැනීමට හැකි ලෙස නඩුව ඉදිරියට පවත්වා ගෙන යා යුතු බව ය.

ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙසේ සභාවේ අදහස් ඉදිරිපත් වූ බැවින් නඩු ගාස්තු ඉල්ලා ලිඛිතව නීතිඥතුමාගෙන් ඉල්ලීම් කරන බව ය.

**03.සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම.**

**04.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.**

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා.**

I. <u>ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ යෝජනා.</u>

01. රත්නපුර පාර වම වරිපනම් අංක 755/17 ට අයත් ඇස්බැස්ටෝස් වහලය , තහඩු වහලය සහිත නිවස දේපල විස්තරය සඳහා වාර්ෂික වරිපනම් මුදල රු.981.42ක් වන අතර 2022.12.31 දිනට හිඟ වරිපනම් මුදල වන රු.4,907.14 වේ.එච්.ආර්.ඇග්නස් යන අය විසින් මෙම හිඟ මුදල් ගෙවීමට වත්කමක් නොමැති බව දන්වා ඇත.ඒ සම්බන්ධව අංක 171 දෙනවක පාතකඩ වසම භාර ග්‍රාම නිලධාරී , පැල්මඩුල්ල සහකාර ප්‍රාදේශීය ලේකම් හා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ආදායම් පරීක්ෂක තුමිය ලබා දුන් වාර්තා ද සලකා බලා සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධව අංක 171 දෙනවක පාතකඩ වසම භාර ග්‍රාම නිලධාරී , පැල්මඩුල්ල සහකාර ප්‍රාදේශීය ලේකම් හා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ආදායම් පරීක්ෂක තුමිය ලබා දුන් ලබා දුන් වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා ප්‍රකාශ කළ සිටියේ එච්.ආර්.ඇග්නස් යන අයට සහෝදරියක් සිටින බවත් , වරිපනම් බදු ගෙවීමට තරම් අපහසුතාවයක් නොමැති බවත් ය.ඊට අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.වී.උපාලි මැතිතුමා පවසා සිටියේ එච්.ආර්.ඇග්නස් යන අයව සභාවට කැඳවා වරිපනම් ගෙවීමේ ඇති වැදගත්කම පහදා දිය යුතු බව ය.අවසාන වශයෙන් ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම තැනැත්තාට ගෙවීමේ හැකියාවක් තිබේ නම් අය කර ගැනීම සුදුසු බවත් , මේ සම්බන්ධව නැවත ආදායම් පරීක්ෂතුමියගෙන් වාර්තාවක් ලබා ගෙන ඒ අනුව කටයුතු කිරීම සුදුසු බව ය.

<u>තීරණ අංක 01</u>

රත්නපුර පාර වම වරිපනම් අංක 755/17 ට අයත් ඇස්බැස්ටෝස් වහලය , තහඩු වහලය සහිත නිවස දේපල විස්තරය සඳහා වාර්ෂික වරිපනම් මුදල රු.981.42ක් වන අතර 2022.12.31 දිනට හිඟ වරිපනම් මුදල වන රු.4,907.14 වන අතර එච්.ආර්.ඇග්නස් යන අය විසින් මෙම හිඟ මුදල් ගෙවීමට වත්කමක් නොමැති බව දන්වා ඇති නිසා ඒ සම්බන්ධව අංක 171 දෙනවක පාතකඩ වසම භාර ග්‍රාම නිලධාරී , පැල්මඩුල්ල සහකාර ප්‍රාදේශීය ලේකම් හා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ආදායම් පරීක්ෂක තුමිය ලබා දුන් වාර්තා හා වසම භාර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමාගේ අදහස් සලකා බලා නැවත ආදායම් පරීක්ෂතුමියගෙන් මේ සම්බන්ධව වාර්තාවක් ලබා ගැනීම සුදුසු බවත් , එම වාර්තාවෙහි එච්.ආර්.ඇග්නස් යන හිඟ වරිපනම් මුදල කොටස් වශයෙන් හෝ ගෙවීමට එකඟ වන්නේ නම් කොටස් වශයෙන් හෝ සභාවට අය කර ගැනීම සුදුසු බවත් , නැතිනම් නැවත මෙම යෝජනාව සභාවට ඉදිරිපත් කර සුදුසු තීරණයක් ලබා ගැනීම සුදුසු බවටත් ඒකමතිකව සභා සම්මත විය.

**02.** පැල්මඩුල්ල විද්‍යාල මාවතේ පිහිටි වරිපනම් අංක 11/1 දරණ කඩ කාමරය නීත්‍යානුකූල නොවන ආකාරයෙන් අතුරු බදු දීම සම්බන්ධව 2022.05.27 වන දින පැවැත්වූ විමර්ෂණ කමිටුවට අනාවරණය වූ කරුණු හා කමිටුවේ නිර්දේශයන් සහිත වාර්තාව අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා මහා සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ කමිටුවේ වාර්තාව ලැබී ඇති බවත් , ඒ අනුව භූමිය සම්බන්ධව පවතින නීතිමය ගැටළුව හා මෙම අතුරු බදු දුන් දේපල හා අනවසර ඇදා ගැනීම් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම සම්බන්ධව අධිකරණයට කරුණු වාර්තා කර , අධිකරණයේ නිසි අවසරය ලබා ගැනීමෙන් අනතුරුව අදාල දේපල පවරා ගැනීමටත් , අයවිය යුතු හිඟ බදු මුදල් දේපල බදුගත් අයගෙන් අය කර ගැනීමටත් කමිටුව වාර්තාවෙහි නිර්දේශ කර ඇති බව ය.

කමිටුව විසින් ලබා දුන් වාර්තාව අනුව කටයුතු කිරීම සුදුසු බවත් , එම ගොඩනැගිල්ලෙහි ප්‍රතිසංස්කරණ කටයුත්තක් සිදු වන බවත් සභාවේ දේපල ආරක්ෂා කර ගැනීමට අවධානයෙන් සිටිය යුතු බවත් අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටින ලදී.

එම ප්‍රතිසංස්කරණ කටයුත්ත නතර කරන ලෙස උපදෙස් ලබා දුන් බවත් , කමිටු වාර්තාව අනුව කටයුතු කරන ලෙස ගරු ලේකම්තුමාට බලය පවරන බවත් ය.

මෙවැනි අවස්ථාවක දී නිවැරදිව කරුණු දැන අධිකරණයට යා යුතු බවත් , නැතිනම් සභාවට අසාධාරණයක් සිදු විය හැකි බවත් , තමා දැනුවත්ව එම දේපල බදුගත් අය සභාවට යම් ගාස්තුවක් ගෙවීමට තිබේ නම් ගෙවීමට සූදානම් බවට ලිපි කිහිපයක්ම එවා ඇති බවත් , මෙම කාල වකවානුව තුළ සානුකම්පිතව සිතා කටයුතු කළ යුතු බවත් , මීට අමතරව සභාවට අයත් දේපල තවත් ඇති බවත් ඒවා සම්බන්ධව ද කටයුතු කළ යුතු බවත් ගරු උප සභාපති ඩී.වී.උපාලි මැතිතුමා පවසන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සූරවීර මැතිතුමා පවසා සිටියේ දේපල බදුගත් අය විසින් ගෙවීම් කිරීමට තිබේනම් ඒ සම්බන්ධව තොරතුරු ලබා දෙන ලෙස සභාවෙන් ඉල්ලීම් කර ඇති බවත් , මෙම කාල වකවානුව තුළ රටෙහි පවතින වාතාවරණය මත සිතා ඉදිරියට කටයුතු කළ යුතු බවත් , සභාව විසින් සතිපොළෙහි ඇති කඩ කාමර ලක්ෂ 7 ක මුදලකට බදුකරුවන්ට බදු දුන් නමුත් ඊට වඩා විශාල මුදලකට ඔවුන් නැවත වෙනත් අයට පැවරීම් කර ඇති බවට ආරංචි වූ බවත් ඒ සම්බන්ධව සොයා බැලීම සුදුසු බවටත් එතුමා පවසන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ නගරය ආසන්න කඩයක් බදු දීමේ දී එක් කඩයක් රු.60,000.00 ක මුදලකටවත් ලබා දීම සුදුසු බව ය.

ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ සභාවට මුල් ගැනුම්කරුවන් බදු ගෙවන බවත් , ලේඛන වලද මුල් ගැනුම්කරුවන්ගේ තොරතුරු සඳහන් වන බවත් ය.කමිටුවේ වාර්තාවට පිටුපා සභාවට කටයුතු කළ නොහැකි බවත් , ලේඛන සියල්ල පරීක්ෂා කර මෙම වාර්තාව ලබා දී ඇති බවත් , පොළෙහි තිබුන කඩ ඉවත් කරන අවස්ථාවේ වෙළෙඳසැල් වල සිටි පුද්ගලයින්ටම නැවත ප්‍රතිසංස්කරණය කිරීමෙන් අනතුරුවත් කඩ කාමර ලබා දීමට තීරණය කළ බවත් , නගරයෙහි ඇති අනෙක් කඩකාමර වලින් බදු අය කරන ආකාරයට සභාවේ දේපල බදු දිය නොහැකි බවත් , තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා දුන් වාර්තා අනුව එකල බදු දීමේ කටයුතු හා මාසිකව සභාවට අය කර ගන්නා මුදල් අය කර ගන්නා බවත් , මාසිකව සභාවට ගෙවන මුදල් අය කිරීමට කාල සීමාවක් ඇති බවත් කාල සීමාව අවසන් වූ පසු නැවත තක්සේරු කර මුදල් සංශෝධනය කළ හැකි බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

**<u>තීරණ අංක 02</u>**

පැල්මඩුල්ල විද්‍යාල මාවතේ පිහිටි වරිපනම් අංක 11/1 දරණ කඩ කාමරය නීත්‍යානුකූල නොවන ආකාරයෙන් අතුරු බදු දීම සම්බන්ධව 2022.05.27 වන දින පැවැත්වූ විමර්ෂණ කමිටුවට අනාවරණය වූ කරුණු හා කමිටුවේ නිර්දේශයන් සහිත වාර්තාව සලකා බලා ඒ අනුව භූමිය සම්බන්ධව පවතින නීතිමය ගැටළුව හා මෙම අතුරු බදු දුන් දේපල හා අනවසර ඇදා ගැනීම් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම සම්බන්ධව අධිකරණයට කරුණු වාර්තා කර , අධිකරණයේ නිසි අවසරය ලබා ගැනීමෙන් අනතුරුව අදාල දේපල පවරා ගැනීමටත් , අයවිය යුතු හිඟ බදු මුදල් දේපල බදුගත් අයගෙන් අය කර ගැනීමටත් කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**03.**2022.06.09 දින මහා සභාවේ තීරණ අංක 05 අනුව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් පොදු වෙළෙඳපොළ අංක 14 දරණ මාළු කඩ කාමරය මාස 06 ක කාලසීමාවකට බදු දීම සඳහා නැවත ප්‍රසිද්ධ ලංසු කැඳවීමක් සිදු කළ නමුත් කිසිදු බදුකරුවෙකු ඒ සඳහා ඉදිරිපත් නොවීම නිසා සුදුසු තීරණයක් ලබා ගැනීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බව 2022.06.30 පැවැත් වූ ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කර ඇත.ඒ අනුව සුදුසු තීරණයක් ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා මේ සම්බන්ධව අදහස් දක්වමින් පවසා සිටියේ මාළු කඩ කාමර ටෙන්ඩරය කිසිවෙක් නොගත් නිසා මෙයට යම් කිසි ක්‍රමවේදයක් සකස් කළ යුතු බවත් , සමහර මාළු වෙළෙඳසැල් වල නරක් වූ මාළු විකුණන බවත් , සභාවේ අධීක්ෂණය යටතේ මාළු කඩයක් පවත්වා ගෙන යාම සුදුසු බවත් , සභාවේ මාළු කඩ කාමර ටෙන්ඩරය කිසිවෙක්වත් නොගැනීමට මූලික හේතුව මාළු කඩ 2ක් නගරයෙහි පැවතීම බවත් , එනිසා සභාවට එන ආදායම නැති වී ඇති බවත්ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ මාළු කඩ කාමරය ටෙන්ඩර් නොගැනීමට හේතුව තවත් මාළු කඩ නගරයෙහි තිබීම බව ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ දැනට පවතින මාළු වෙළෙඳසැල් නීත්‍යානුකූලව පවතින බවත් , මීට හේතුව වත්මනෙහි රට තුල පවතින වාතාවරණය මත මාළු වෙළෙඳාම පහතට වැටී තිබීම බවත් , ගිය වර්ෂයේ ද මෙවන් අවස්ථාවක දිනකට අය කළ හැකි මුදලක් තීරණය කර ගරු ආණ්ඩුකාරතුමාට යැවූ බවත් , ඊට අනුමැතිය ලැබුනු බවත් මේ වතාවේ දී ද එසේ කිරීමට සිදු වන බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ සති පොළෙහි කඩ කාමර වල බදුකරුවන් නොසිටී නම් ඒවා පවර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බව ය.ඊට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ සභාවෙන් සමීක්ෂණයක් සිදු කරමින් පවතින බවත් , සභාවට නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතු බැවින් නිවැරදි තොරුතුරු ලබා ගත් පසු සභාවට ඉදිරිපත් කරන බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සුරවීර මැතිතුමා පවසා සිටියේ සභාවට දැනටමත් මාළු වෙළෙඳසැලින් ආදායමක් නොමැති නිසා දිනකට සාමාන්‍ය මුදලක් තීරණය කර ගැනීම සුදුසු බව ය.ඒ අනුව ගරු සභාපතිතුමා පවසා සිටියේ දිනකට රු.750.00 කට මාළු කඩ කාමරය ටෙන්ඩර් කිරීම සුදුසු බව ය.ඊට ගරු සභාවම එකඟතාවය ප්‍රකාශ කරන ලදී.

<u>**තීරණ අංක 03**</u>

2022.06.09 දින මහා සභාවේ තීරණ අංක 05 අනුව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් පොදු වෙළෙඳපොළ අංක 14 දරණ මාළු කඩ කාමරය මාස 06 ක කාලසීමාවකට බදු දීම සඳහා නැවත ප්‍රසිද්ධ ලංසු කැඳවීමක් සිදු කළ නමුත් කිසිදු බදුකරුවෙකු ඒ සඳහා ඉදිරිපත් නොවීම නිසා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ඇතිව , දිනකට රු.750.00 කට යටත්ව හා යම්කිසි හේතුවක් මත මාළු කඩය වසා තැබුවහොත් එම වසා තබන දින වලට අදාල දෛනික මුදල කපා හැරීමට යටත්ව , නැවත ටෙන්ඩර් කැඳවන තුරු 2022 වර්ෂයේ ඉදිරි මාස 05 සඳහා පමණක් කැමති පුද්ගලයෙකුට මාළු කඩය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**04.**2021 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ යටතේ පෙන්වා ඇති පරිදි පැල්මඩුල්ල , මාරපන හා පාතකඩ යන පුස්තකාල තුනෙහි ඌන පොත් 19 සම්බන්ධව 2017.05.04 දිනැති ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක 2/2017 හා 2016.12.22 දිනැති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් නිකුත් කර ඇති 2004/පුස/01 ( 2016 - සංශෝධිත) චක්‍රලේඛය සම්බන්ධව කටයුතු කිරීමට අදාලව 2022.04.27 දිනැති පුස්තකාල උපදේශන කමිටුවේ වාර්තාව සලකා බලා සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 04**</u>

2022.04.27 දිනැති උපදේශන කමිටුවේ නිර්දේශ , ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක 2/2017 හා 2016.12.22 දිනැති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ 2004/පුස/01 ( 2016 - සංශෝධිත) චක්‍රලේඛය සලකා බලා 2021 භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ යටතේ පැල්මුඩල්ල , මාරපන හා පාතකඩ යන පුස්තකාල තුනෙහි ඌන පොත් වශයෙන් හඳුනා ගෙන ඇති රු.3,797.50 ක් වටිනා පොත් 19 සඳහා උක්ත චක්‍රලේඛ වල සඳහන් පරිදි 25% ක වටිනාකම අඩු කර ඉතිරි වටිනාකම පුස්තකාල කාර්යය මණ්ඩලයෙන් අයකර ගැනීමට ඒකමතිකව සභා සම්මත විය.

**05.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු වාහන වල සේවා පිටස්තර ආයතන මඟින් සිදු කරනු ලබන අතර ඒ සඳහා විශාල මුදලක් දැරීමට සිදු වන නිසා සභාව සතු වාහන වල සේවා කටයුතු සභාවේ භූමිය තුළ දීම සිදු කර ගැනීම සඳහා සුදුසු ස්ථානයක් සකස් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

වාහනයකට ඔයිල් දැමීමට යන මුදලත් සමඟ එම ඔයිල් සභාවෙන් මිල දී ගෙන තබා ගෙන දැමීමෙන් සභාවට එක් වාහනයකින් ලැබෙන ලාභය රු.5,000ක් පමණ වන බවත් , වාහන සේවා කිරීමෙන් පවා සභාවට විශාල ලාභයක් ලබා ගත හැකි බවත් , අධීක්ෂණ නිලධාරියෙකුට හා සභාවේ සේවකයෙකුට භාර දී ගබඩාවට බඩු ලබා ගෙන කටයුතු සිදු කරගෙන යාම සුදුසු බවත් , පුහුණු ශ්‍රමය අවශ්‍ය වුවහොත් ලබා ගන්නා බවත් , වත්මනෙහි පවතින වාතාවරණය මත මෙම කටයුතු කඩිනමින් සිදු කළ යුතු බවත් , තාක්ෂණික නිලධාරීන්ගේ වාර්තා ලබා ගෙන ඒ අනුව කටයුතු සිදු කරන බවත් ගරු සභාපතිතුමා පවසා සිටින ලදී.

<u>**තීරණ අංක 05**</u>

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු වාහන වල සේවා පිටස්තර ආයතන මඟින් සිදු කරනු ලබන අතර ඒ සඳහා විශාල මුදලක් දැරීමට සිදු වන නිසා සභාව සතු වාහන වල සේවා කටයුතු සභාවේ භූමිය තුළ දීම සිදු කර ගැනීම සඳහා සුදුසු ස්ථානයක් සකස් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**06.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ දෘඩාංග ගබඩාවෙහි රාක්කයක් සැකසීමට ගබඩාවෙහි ඉන්වෙන්ට්‍රියේ ඇතුලත් GI බට 26 ක් යොදා ගත් අතර 2021 භාණ්ඩ සමීක්ෂණ නිර්දෙශ අංක 05ට අනුව එම GI බට ඉන්වෙන්ට්‍රි ලේඛනයෙන් කපා හැරීමට මහා සභාවේ අනුමැතිය අවශ්‍ය බව දන්වා ඇත.ඒ සම්බන්ධව කාර්මික නිලධාරීතුමාගේ වාර්තාව ද සලකා බලා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>තීරණ අංක 06</u>

කාර්මික නිලධාරීතුමාගේ වාර්තාව ද සලකා බලා , පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ දෘඩාංග ගබඩාවෙහි රාක්කයක් සැකසීම සඳහා යොදා ගත් ගබඩාවෙහි ඉන්වෙන්ට්‍රියේ ඇතුලත් GI බට 26 ගබඩා ඉන්වෙන්ට්‍රි ලේඛනයෙන් කපා හැරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**07.**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කම්කරුවන් දිනපතා රාජකාරියට වාර්තාකළ යුතු බැවින් රට තුළ පවතින ඉන්ධන අර්බුදය හා බස් ගාස්තු ඉහළ යාම නිසා පළාත් සභාවේ අනුමැතිය ඇතිව එම සෞඛ්‍ය කම්කරුවන්ට ගමන් වියදමක් ගෙවීම සුදුසු බවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ මේ සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කළ බවත් , කෙටි කාල සීමාවකට යටත්ව මෙම තීරණය ලබා ගන්නා ලෙස එතුමා පැවසූ බවත් , විවිධ සෞඛ්‍ය කම්කරුවන්ට සභාවට ඇති දුර ප්‍රමාණය සකසා බලා ගමන් වියදම සකස් කළ යුතු බවත් , ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පැමිණි පසු මෙම තීරණය ක්‍රියාත්මක කළ හැකි බවත් ය.

<u>තීරණ අංක 07</u>

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කම්කරුවන් දිනපතා රාජකාරියට වාර්තා කළ යුතු බැවින් රට තුළ පවතින ඉන්ධන අර්බුදය හා බස් ගාස්තු ඉහළ යාම නිසා පළාත් සභාවේ අනුමැතිය ඇතිව , එම සෞඛ්‍ය කම්කරුවන්ට සේවා ස්ථානයට ඇති දුර සලකා බලා ක්‍රමවේදයක් සකස් කර , මාස 3ක කාලයක් ගමන් වියදම් ගෙවීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**06.කාරක වාර්ථා සලකා බැලීම - 2022-06-09 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව හා 2022.06.30 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව අනුමත කිරීම.**

ඒ අනුව 2022-06-09 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව හා 2022.06.30 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.ආරියරත්න මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමා මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**07.2022-06-01 සිට 2022-06-30 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගිති වාර්තාව සලකා බැලීම.**

ගෙවීම් වාර්තාව සම්බන්ධයෙන් අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ ගෙවීම් වාර්තාවෙහි එකඟ විය නොහැකි කාරණා බොහොමයක් ඇති බවත් , KH – 3881 ජීප් රථයට රු.96,000.00 ක ඉන්ධන ලබා ගෙන ඇති බවත් , PF – 7484 කැබ් රථය සඳහා රු.98,700.00 ක ඉන්ධන ලබා ගෙන ඇති බවත් , තව ද සභාවේ වාහන සඳහා ඉන්ධන ලබා දීම වශයෙන් මුදල් ගෙවා ඇති බවත් ය.

KH – 3881 ජීප් රථය සඳහා මැයි මස ඉන්ධන දීමනා ගෙවීම ජූනි මස ගෙවීම් වාර්තාවේ සඳහන්ව ඇති බවත් , සභාවේ අත්‍යවශ්‍ය සේවා සඳහා ඩීසල් අවශ්‍ය වන නිසා ඉන්ධන ලබා ගත හැකි අවස්ථා වල ඉන්ධන ලබා ගෙන ගබඩා කර තබා ගන්නා බවත් , මේ වන විටත් නිශ්චිතව ගබඩා කළ ඩීසල් සංචිතයක් සභාව තුළ පවතින බවත් , සභාවට වුවද වෙන ඉන්ධනහල් වලින් බැරල් වලට ඉන්ධන ලබා නොදෙන බවත් , එනම් ඉන්ධන ගබඩා කර තබා ගැනීමට ඉන්ධන ලබා ගැනීම නිසා ඉන්ධන සඳහා මෙවර ගෙවීම් වාර්තාවෙහි වැඩි වියදමක් සිදු වී තිබීමට හැකි බව ගරු සභාපතිතුමා පවසන ලදී.

අදහස් දක්වමින් ගරු උපසභාපතිතුමා පවසන ලද්දේ ඉන්ධන සංචිතයක් තබා ගැනීම සුදුසු බවත් , එමඟින් කිසිදු ගැටළුවකින් තොරව අත්‍යවශ සේවා සැපයීමට විශේෂයෙන් කසළ එකතු කිරීමට ආදියට අවස්ථාව ලැබෙන බව ය.

ඒ සම්බන්ධව නොදන්නා නිසා විමසීමක් කළ බවත් , සමූපකාර ඉන්ධනහල මඟින් කිරිබත්ගල බස් වලට ඉන්ධන නිකුත් කළ ද අනෙක් බස් වලට සේම අනෙක් වාහන වලට ඉන්ධන නිකුත් නොකරන බවත් , එහි විශාල වංචාවක් සිදු වන බවත් , එහි කළමනාකරුගේ ගැටළුවක් බවත් , මේ සම්බන්ධව අවධානය යොමු කළ යුතු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසන ලදී.

එය විශාල ගැටළුවක් බව ගරු සභාපතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමා පවසන ලදී.

ඒ සම්බන්ධව අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ මෙම සමූපකාරයේ කළමනාකරු පිළිබඳව විවිධ කටකතා සමාජය අතර පවතින බව ය.එනම් එම කළමනාකරු කිරිබත්ගල ප්‍රදේශයේ පුද්ගලයෙක් බවත් , ඔහුගේ මෝටර් බයිසිකලයේ ඉන්ධන විශාල ප්‍රමාණයක් පිරවිය හැකි ටැංකියක් ඇති බවත් , එතුමා උදැසන සේවට වාර්තා කළ පසුව , දහවල් කාලයේ , නැවත සේවා ස්ථානයෙන් පිටව යන හවස් වරුවේ ආදී වශයෙන් දිනකට කිහිප වතාවක් ම ඉන්ධන පුරවන බවත් , එම ඉන්ධනහලෙන් බැකෝ යන්ත්‍ර හා ටිපර් යන්ත්‍ර සඳහා සියලුම ඉදිකිරීම් නැවතී ඇති මෙවැනි කාල වකවානුවක් තුළ ඉන්ධන ලබා දෙන බවත් , එම වාහන අයිතිකරුවන් එම ඉන්ධන වැඩි මුදලකට ජනයාට විකුණන බවත් , මිනිස්සු ඒ සම්බන්ධව අවධානයෙන් සිටින බවත් , මෙම කළමනාකරු නිසා පැල්මඩුල්ල තුළ විශාල ගැටළුවක් ඇති විය හැකි බවත් , පැල්මඩුල්ලට එන ඉන්ධන සාධාරණ ක්‍රමයකට ජනයා අතර බෙදිය යුතු බවත් , මෙම කළමනාකරුව තාවකාලිකව හෝ මාරු කළ යුතු බවත් , තමන් ද පෞද්ගලිකව ඉන්ධන නොමැති වීම නිසා විවිධ අවස්ථා වල දී අපහසුතාවයන්ට පත් වූ බවත් ය.

සභාව මඟින් ගරු මන්ත්‍රීවරුන්ට ඉන්ධන ලීටර් 3 බැගින් ලබා දෙන බව පැවසූ විට තමන් ද එම ස්ථානයට පැමිණි බවත් , එහි දී ඉන්ධන ලීටර් 2ක් පමණක් ලබා දුන් බවත් , තමන්ට සභාව ළඟ සිට නිවසට යාමට තෙල් ලීටර් 01ක් වැය වන බවත් , එවැනි අවස්ථා වල දී අපහසුතාවයට පත් වූ බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා පවසන ලදී.

ගෙවීම් වාර්තාව සම්බන්ධයෙන් අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ සභාපතිතුමාගේ වාහනය සඳහා මාසයේ මුල් දින කිහිපය සඳහා පමණක් ලෙස ආදී වශයෙන් මුදල් ගෙවා ඇති බව ය.ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ සභාවට පැමිණි දින සිට ඉන්ධන ලබා ගැනීමේ බිල්පත් ඉදිරිපත් කර අදාල මුදල් ලබා ගැනීම මසකට දෙවතාවක් සිදු කළ බවය.එනම් මාසයේ මුල් දින 15ට අදාලව බිල්පත් සමඟ වෙනම වවුචරයකුත් , මාසයේ අවසාන දින 15 ට අදාලව බිල්පත් සමඟ වෙන ම වවුචරයකුත් ආදී වශයෙන් ඉදිරිපත් කරන බව ය.ඊට පරිභාහිරව කිසිදු අවස්ථාවක කටයුතු කර නොමැති බවත් , වර්තමානයේ පවතින ඉන්ධන මිල සමඟ ඉන්ධන කොපමණ ප්‍රමාණයක් ලබා ගෙන තිබේ ද යන්න බැලිය හැකි බවත් ය.

ගෙවීම් වාර්තාවෙහි සී/ස පැල්මඩුල්ල විවිධ සේවා සමූපකාර සමිතියට ඉන්ධන ලබා ගැනීම සඳහා ඇප මුදලක් තැන්පත් කිරීම ලෙස සඳහන් වන්නේ කුමක් ද යන්න ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විමසන ලදී.මුල සිට ම පැල්මඩුල්ල කේ.ඩී.යූ.ඉන්ධනහලෙන් සභාවට ඉන්ධන ලබා ගැනීම සිදු කළ ද මෙම වාතාවරණය මත පැල්මඩුල්ල සමූපකාරයට පමණක් ඉන්ධන ලැබීම නිසා ඉන්ධන එම ස්ථානයෙන් ලබා ගෙන ඊට අදාල චෙක්පත ලබා දීමට දින කිහිපයක් ගත වීම නිසා රු.ලක්ෂ 2ක මුදලක් තැන්පත් කර ඉන්ධන ලබා ගන්නා බවත් , එවිට එම මුදල් සීමාවේ එම ආයතනයට ඉන්ධන ඇනවුම් කළ හැකි බවත් , ඉන්ධන ලබා දීම සාමාන්‍ය පරිදි වූ විට නැවත කේ.ඩී.යූ.ඉන්ධනහලෙන් ඉන්ධන ලබා ගන්නා බවත් , එවිට එම තැන්පත් කළ මුදල සී/ස පැල්මඩුල්ල විවිධ සේවා සමූපකාර සමිතියෙන් සභාවට ලබා ගත හැකි බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

2022-06-01 සිට 2022-06-30 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගිති වාර්තාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**08.**වෙනත් කරුණු.

- **සභාව දැනුවත් කිරීමේ නිවේදන හා අදහස් දැක්වීම්.**

<u>වතු ආශ්‍රිත ප්‍රදේශ සඳහා සහනාධාර ලෙස සහල් බෙදීමේ දී ඇති වන ගැටළු සම්බන්ධව.</u>

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ටී.මෝහන්දාස් මැතිතුමිය ප්‍රකාශ කළ සිටියේ සහනාධාර බෙදීමේ දී වත්තෙහි සේවය කරන අයට පමණක් සහල් ලබා දී ඇති බවත් , ලෙල්ලොපිටිය වත්ත ගනේගම කොටස ලෙස වත්ත සම්බන්ධව ලේඛන වල සඳහන් වන බවත් , මෙම ගැටළුව හේතුවෙන් ප්‍රාදේශීය ලේකම්තුමාට කතා කළ බවත් , සහල් වත්තට ගෙන ගිය බවට එහි දී පැවසුව නමුත් සහල් නොලැබුනු බවත් , සහනාධාර බෙදා දීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ට සහභාගී වීමට නොහැකි බවට ප්‍රචාරයක් යැවූ බවත් ය.

අදහස් ඉදිරිපත් කරමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමා පවසා සිටියේ බුලත්වත්ත ඇග්‍රොලයින් වත්ත පුද්ගලික වත්තක් බවත් , වත්තෙහි සේවය කරන අය සඳහා පමණක් සහල් ලබා දෙන බවත් , විදුලිය ලබා ගැනීමේ දී වුව ද වත්තෙහි සේවය කරන අයට පමණක් අයදුම්පත්‍ර අත්සන් කරන බවත් ය.

බැරැණ්ඩුව ප්‍රදේශයේ ගැටළුවක් ඇති වූ බව දැනගන්නට ලැබුනු බවත් , එම අවස්ථාවේ ම ගරු ප්‍රාදේශීය ලේකම්තුමාට ඒ පිළිබඳව පැවසූ බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

අදහස් දක්විමන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ සහල් වත්ත හරහා බෙදා ඇති බවත් , වත්තෙහි සේවය කරන පිරිසට පමණක් සහල් බෙදා ඇති බවත් , එමඟින් වත්තෙහි සේවය කිරීම සඳහා පිරිස රැස් කිරීමට වත්තෙහි නිලධාරීන් කටයුතු කරන බවත් , වත්තෙහි සේවය නොකරන අහිංසක ජනයා එවැනි අවස්ථා වල අසරණ තත්වයට පත් වන බවත් , ප්‍රාදේශීය ලේකම්තුමා සමඟ සාකච්ඡා කර වැඩපිළිවෙලක් සකස් කළ යුතු බව ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.රගවන් මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ ගිය මාසයේ පොහොය දිනට පෙර තම වසමේ සහල් බෙදා දුන් බවත් , ඊට වතු සමාගම සහ ප්‍රාදේශීය ලේකම්කාර්යාලයේ නිලධාරීන් දෙදෙනෙක් සම්බන්ධ වූ බවත් , එහි දී සමහර ජනයාට පමණක් සහල් ලබා දුන් බවත් , ඒ පිළිබඳව ජනයා තමන්ට පැමිණිලි කළ බවත් , ජනතාව සමඟ එම ස්ථානයට ගිය බවත් , අදාල ලේඛනයට අනුව සහල් බෙදා නොදෙන බවත් , වත්තෙහි සේවය කරන අයට පමණක් සහල් බෙදා දුන් බවත් ය.නැවත පෝය දිනෙන් පසුව සහල් බෙදූ බවත් , එහි දී සහල් සඟවා තිබූ බවත් , ඒ පිළිබඳව විමසූ විට වත්තෙහි සේවය කරන අයට ලබා දීමට බව පැවසූ බවත් , ඉහළ නිලධාරීන්ට පවසන බවට කියූ විට සහල් බෙදා දුන් බවත් ය.ඉදිරියේ දී වතු සමාගම් හරහා සහනාධාර ලබා නොදී ඊට ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කළ යුතු බව එතුමා පවසන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ මෙවැනි සහනාධාර බෙදීමේ දී නිවැරදි , සාධාරණ වැඩ පිළිවෙලක් සකස් කිරීම යෝග්‍ය බව ය.ඉන්ධන ලබා දීමේ දී ද නිසි වැඩ පිළිවෙලක් නොමැති බව එතුමා පෙන්වා දෙන ලදී.

මේ සම්බන්ධව ලිඛිතව ප්‍රාදේශීය ලේකම්තුමාට ලිපියක් යොමු කරන බව ගරු සභාපතිතුමා පවසන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා.

සියලු දෙනාගේ ම පැවති වැරදි තීරණ හේතුවෙන් අපේ රට මෙතරම් ප්‍රපාතයකට වැටී ඇති බවත් , මීට පෙර සභා වාර්තා වල බොහෝ සේ වැසිකිළි ආධාර , නිවාස ආධාර ලබා දීම් තිබූ බවත් , එමඟින් මිනිස්සු තනිව ඉපයීමට වඩා තවකෙනෙකුගෙන් යැපීමට හුරු වූ බවත් , ජනයා ඡන්දය ලබා දීමේ දී ද නොමිලේ සහනාධාර බොහොමයක් ලබා දෙන පුද්ගලයාට ඡන්දය ලබා දීමට පෙළඹෙන බවත් , මෙම ආකල්පයෙන් අප ඈත් විය යුතු බවත් , නැතිනම් කුමන පාලකයා පැමිණිය ද රටට යහපතක් සිදු නොවන බවත් , සමෘද්ධි සහනාධාර වල සිට විවිධාකාරයෙන් මිනිසුන්ට කොපමණ සහනාධාර ප්‍රමාණයක් ලබා දී තිබේ ද යන්නත් , එක් සහනාධාරයක් හෝ ලබා දීමට නොහැකි වුවහොත් එම පක්ෂය පහතටම වැටෙන බවත් , මෙය වෙනස් කිරීමට හොඳ ම ස්ථානය ප්‍රාදේශීය සභාව බවත් , අනාගතයට රටක් තිබිය යුතු බවත් , සාධාරණ හේතු මත අරගල තිබුන ද වත්මනෙහි අරගල නැවතිය යුතු බවත් , නැතිනම් රට ඉදිරියට කර ගෙන යාමට කිසිවෙක් නොමැති බවත් , දිනක් අරගලය ඇදෙන විට රට තවත් අවුරුද්දක් පමණ පසුපසට ගමන් කරන බවත් , අධ්‍යාපනය , ඉන්ධන වැනි අත්‍යවශ්‍ය දේවල් නොමැති වීම නිසා අරගලය සිදු කළ ද එමඟින් කිසිවෙකුට හානියක් සිදු නොවිය යුතු බවත් , සහනාධාර ලබා දීම වෙනුවට පොදුවේ මං මාවත් ප්‍රතිසංස්කරණය කිරීම වැනි යෝජනා වලට යා යුතු බවත් ඒවා ප්‍රදේශයටම වටිනා බවත් එතුමා පවසන ලදී.

ගරු විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා.

මිනිසුන්ට ආහාර ද්‍රව්‍ය , ඉන්ධන , අත්‍යවශ්‍ය දේවල් නැති වීම හේතුවෙන් මිනිසා අරගල කිරීමට පෙළඹුන බවත් , මිනිස්සු විවිධාකාරයෙන් දුක් විදි බවත් , ජීවත් වීමට නොහැකි තත්වයක් උදා වූ බවත් , එනිසා ජනතා හඬට ඇහුන්කන් දී ස්ථාවර වැඩ පිළිවෙලකට යා යුතු බවත් එවිට ජනතාව ඊට අනුගත වන බවත් , පසුගිය අවධියේ ජනතාවට සහනාධාර බෙදීමේ දී ඒ පිළිබඳව ගමේ මන්ත්‍රීතුමාගෙන් විමසීම් කළ ද ඒ පිළිබඳව නිශ්චිතව පිළිතුරක් ලබා දීමට අපොහොසත් වූ බවත් , එනිසා ගමේ මන්ත්‍රීතුමාව සහනාධාර බෙදීමේ දී දැනුවත් කරන ලෙස ප්‍රාදේශීය ලේකම්තුමාව දැනුවත් කිරීම සුදුසු බවත් , වතු වල සහනාධාර ලබා දීමේ දී ඡන්ද නාම ලේඛනය අනුව ලබා දීම සුදුසු බවත් ගරු විපක්ෂනායකතුමා පවසන ලදී .

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා.

අදහස් දක්වමින් එතුමා පවසා සිටියේ තමන්ට උදවු කරන පුද්ගලයා කුමන වැරැද්ද කළ ද තමන් ආරක්ෂා කර ගැනීමට උත්සාහ කරන බවත් , මෙම දේශපාලන රටාව වෙනස් කළ යුතු බවත් , අරගල සිදු කර ජනතාවට බලය අරගෙන ඇති බවත් , එය හොඳ ආදර්ශයක් නොවන බවත් , අරගල නතර කළ යුතු බවත් , අසාධාරණයන් ඉදිරියේ අදහස් ඉදිරිපත් කළ නොහැකි වාතාවරණයක් රට තුළ පවතින බවත් , ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ නිවසට ගිනි තැබීම පිළිබඳව කණගාටු වන බවත් , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමාගේ කතාව අගයන බවත් , මන්ත්‍රීවරුන්ට , පොලීසියට , රණවිරුවන්ට ජනතාව මෙම අවස්ථාවේ දෝෂාරෝපණ එල්ල කළ ද ඔවුන්ගෙන් අපට විශාල සේවයක් සිදු වන බවත් , සහනාධාර බෙදීමේ දී ග්‍රාම සේවක හා සංවර්ධන නිලධාරී සම්බන්ධ කර ගනිමින් යෝග්‍ය වැඩපිළිවෙලක් සකස් කළ යුතු බවත් ය.

පෙ.ව.11.19 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා සභාවෙන් පිටව යන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකතුමාර මැතිතුමා

මිනිසුන්ට අත්‍යවශ්‍ය දේවල් නැති වන විට අරගල සිදු කළ බවත් , එය ජනතාවගේ අරගලයක් බවත් , එය සාධාරණ අරගලයක් බවත් , මිනිස්සුන්ට ඉවසිය හැකි සීමාවක් ඇති බවත් එතුමා පවසන ලදී.

පෙ.ව.11.24 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.ඉන්දික කුමාර දිසානායක මැතිතුමා සභාවෙන් පිටව යන ලදී.

<u>ගරු උප සභාපති ඩී.වී.උපාලි මැතිතුමා</u>

මිනිසුන්ට අත්‍යාවශ්‍ය දේවල් නොමැති වීම හේතුවෙන් අරගල කිරීම සාධාරණ බවත් , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමාගේ කතාවට එකඟ වන බවත් , අරගලය හේතුවෙන් ලංකාවේ කිසිදා නොවුන දේවල් බොහොමයක් සිදු වී ඇති බවත් , එමඟින් ලංකාවටම කළු පැල්ලමක් ඇති වූ බවත් , අනාගත දරුවන්ට හොඳ රටක් ඉතිරි නොවන බවත් , ගරු හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රටට විශාල සේවයක් කරයි යන්න විශාල බලාපොරොත්තුවක් පැවතිය ද එසේ නොවූ බවත් , අරලියගහ මන්දිරයට හා ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ නිවසට සිදු වූ අපරාධය සම්බන්ධයෙන් කණගාටු වන බවත් , සියලු දෙනාම එකතු වී පක්ෂ දේශපාලනය නැති කළ යුතු බවත් , රටේ ජනාධිපති හා අගමැතියි ඉවත් වූ පසු රටෙහි පාලනය ගෙනයන්න කිසිවෙක් නොමැති බවත් , රට අකර්මරණය වන බවත් , කිසිවිටක අරගලයෙන් ජනාධිපති පත් කළ නොහැකි බවත් , රටෙහි ව්‍යවස්ථාවක් ඇති බවත් , ඒ අනුව කටයුතු කළ යුතු බවත් , අලුත් පරම්පරාව පෙර පැවති කැරලි සම්බන්ධව නොදන්නා බවත් , මේවා දකින විට තමන්ගේ දේශපාලන ගමන සම්බන්ධව කණගාටු වන බවත් එතුමා පවසන ලදී.

<u>ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමා.</u>

ජනාධිපතිවරු ගණනාවක් ජනාධිපති ධුරය හෙබවූ බවත් , 88 හා 89 කාල වකවානුවල රටෙහි පැවති තත්වය අමතක නොවන බවත් , දේශපාලනඥයින්ගේ නිවාස ගිනිතැබීම සම්බන්ධව තමන් ද විරුද්ධ වන බවත් , බරපතල ආර්ථික අර්බුදයක රට පවතින බවත් , නියමානුකූලව තව දුරටත් අප රටේ මුදල් ව්‍යුහය පහත වැටෙන්න නොදී මහ බැංකු අධිපතිවරයා ශක්තිමත් විය යුතු බවත් , මෙම අවස්ථාවේ ජාත්‍යන්තර විශ්වාස තහවුරු කර ගත යුතු බවත් , ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිට කිසිවක් කළ නොහැකි බවත් , සතුටු විය හැකි තත්වයක් රට තුළ නොමැති බවත් , සෑම අවස්ථාවකම ප්‍රජාතන්ත්‍රවාදී ලෙස රට තුළ බලය ඇති වූ නමුත් පෝලිම් ක්‍රමය නිසා සැබෑ අරගලය නිර්මාණය වූ බවත් , ගරු හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති ලෙස පත් වූ දා පටන් අවුරුදු 2ක් කොවිඩ් 19 වෛරසය පැවති බවත් , එතුමා ඒ අවුරුදු දෙක උපරිමයෙන් ම ජනතාව ගැන සිතා කටයුතු කළ නිසා කොවිඩ් 19 අප රටෙන් තුරන් කිරීමට හැකි වූ බවත් , පක්ෂ විපක්ෂ සියලු දෙනා එතුමා පහළට ඇද දැමීමට කටයුතු කළ නිසා රටට වැඩක් කිරීමට සිටි නායකයෙක්ට ජනාධිපතිධුරයෙන් ඉල්ලා අස්වීමට සිදු වූ බවත් , දේශපාලනය පිළිබඳව බරපතල ප්‍රශ්නයක් ඇති බවත් , රට බොහොම නරක තැනක නතර වී ඇති බවත් , මේ තත්වය මත රටෙහි ඇති වූ විවිධ ගැටුම් මඟින් සිදු වූ දේපල හානි පිළිබඳව සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කිරීමටවත් නොහැකි තත්වයක් උදා වී ඇති බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

- **පසුගිය සභාවේ ලබා ගත් තීරණ සම්බන්ධයෙන් ප්‍රගිතිය සාකච්ඡා කිරීම.**
- **නිවාඩු අනුමත කිරීම.**

අසනීප තත්ත්වය හේතුවෙන් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ඇති ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බිමල්ක ප්‍රමෝදා මැතිතුමාහට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

- **මීළඟ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම**

මහා සභාව 2022 අගෝස්තු 18 වන දින පැවැත්වීමට තීරණය විය.

- **සභාපතිතුමාගේ ස්තූති කතාව.**

අද දින සභාවට පැමිණ සිටින ගරු උපසභාපති තුමන්, විපක්ෂනායකතුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාටත හා මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් , මාධ්‍යවේදී මහතාටත් ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තූති කතාව අවසන් කරන ලදී.

**පෙ.ව. 11.50 ට පමණ සභාවේ කටයුතු අවසන් විය.**

වාර්තා ගත කළේ

2022-08-08 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

ලේකම්
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

ප්‍රාදේශීය සභා .................................................................. මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ....................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

.

2022-08-18 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව